# දැන්වීමයි

## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයේ රාජකාරී අවශ්‍යතාවය සහ සුහසාධනය සලකා බොරලැස්ගමුව, අබේරත්න මාවත කුලී නිවාස සංකීර්ණයේ නිවාස ලබා දීම

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයේ රාජකාරී අවශ්‍යතාවය සහ සුහසාධනය සලකා කුලී නිවාස ලබාදීම සඳහා අධ්‍යයන, පරිපාලන හා අනධ්‍යයන කාර්යමණ්ඩල ස්ථිර සේවක හවතුන්ගෙන් 2026.04.30 වන දින සිට අයදුම්පත්‍ර කැඳවනු ලැබේ. අයදුම්පත්‍රය සෑම පීඨයකම නියෝජ්‍ය/ජ්‍යෙෂ්ඨ/සහකාර ලේඛකාධිකාරී කාර්යාලයෙන්, සාමාන්‍ය පාලන හා සේවා අංශයෙන් හා විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් (https://www.sjp.ac.lk/staff/) බාගත කරගත හැකි අතර සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2026.06.01** දිනට පෙර සාමාන්‍ය පාලන හා සේවා අංශය වෙත භාරදිය යුතුය.

කුලී නිවාස ලබාදීම සම්බන්ධයෙන් පහත සඳහන් කොන්දේසි සැලකිල්ලට ගනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි.

1. සේවා අවශ්‍යතාවය සහ සේවක සුහසාධනය සලකා වර්ෂ 03ක ගිවිසුමකට යටත්ව දෙදෙනෙකු සඳහා වෙන්කරන ලද නිවාස හා පවුල් නිවාස සඳහා අයදුම්පත්‍ර කැඳවනු ලැබේ. (විශ්වවිද්‍යාල සේවා කාලය තුළ කුලී නිවාසයක රැඳී සිටීමේ උපරිම කාලය වර්ෂ 06ක් පමණි.)
2. කුලී නිවාසලාභියා විශ්වවිද්‍යාලය සමඟ ගිවිසුමකට බැඳිය යුතු වේ.
3. සෑම කුලී නිවාසලාභියෙකුගේ වැටුපෙන් මාසිකව නිවාස කුලිය, විදුලිය හා ජලය සඳහා ගාස්තු අයකරනු ලැබේ.
4. නිවැසියන් විසින් පරිභෝජනය කරනු ලබන ජල සහ විදුලි ඒකකයන්ට අමතරව සංකීර්ණයේ ඔබ වෙනුවෙන් වැයවන විදුලි හා ජල බිල්පත්හි වටිනාකම කුලී නිවැසියන් විසින් ගෙවිය යුතු වේ.
5. කුලී නිවාසලාභියෙකුගේ සේවය අත්හිටුවීමකදී සේවය අත්හිටවූ දින සිට මාසයක් ඇතුළත කුලී නිවසින් ඉවත්විය යුතුය.
6. ගිවිසුම් ප්‍රකාරව නියමිත දින කුලී නිවසලාභියෙකු නිවසින් ඉවත් නොවුනහොත් විනයානුකූලව හා නීත්‍යානුකූලව පියවර ගන්නා අතර නිවස කමිටු තීරණය පරිදි අධිභාරයක්ද අයකරගනු ලැබේ.
7. කුලීනිවාස ලබාදීම පිළිබඳ අවසාන තීරණය විශ්වවිද්‍යාලය සතුවේ.

මෙ පිළිබඳ වැඩි විස්තර සාමාන්‍ය පාලන හා සේවා අංශයෙන් ලබාගත හැක. (අභ්‍යන්තර දුරකථන අංක 8242/8248)

ලේඛකාධිකාරී
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
නුගේගොඩ.

ලේඛකාධිකාරී